# භාවනාව පිළිබඳ විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන්ගේ ආකල්පය

සුධාරක හිරන්‍ය පෙරේරා[1]

වසර 2900කට ආසන්න කාලයක සිට ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම බුදු දහම වේ. එබැවින් ඒ හා සම්බන්ධ භාවනාවන් පිළිබඳව ඉතා යහපත් ආකල්පයක් සාමාන්‍ය වැසියා අතර දක්නට ලැබේ. අද වන විට මෙම තත්ත්වය සීඝ්‍රයෙන් භාවනා මධ්‍යස්ථාන ආරම්භ වීම දක්වා ප්‍රවණතාවක් ලෙස වර්ධනය වී ඇත. තරුණ කණ්ඩායම් මේ පිළිබඳව මහත් අවධානයක් දක්වන බව පෙනෙන්නට ඇතත්, ඒ පිළිබඳව සොයා බැලීමට සිදු කෙරුණු පර්යේෂණ දුලභය. විශ්වවිද්‍යාල කණ්ඩායම් යනු රටේ අනාගත ඉහළ තනතුරු නියෝජනය කරන පුද්ගලයන් වන නිසා ඒ පිළිබඳව අවධානයක් යොමු කිරීම වැදගත්ය. ඔවුන් අතර භාවනාව පිළිබඳව දරන ආකල්ප සෙවීම වැදගත් වේ. ඒ මගින් ඔවුන්ගේ ආකල්ප සංවර්ධනයට විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්ති සම්පාදකයන්ට ගත හැකි ක්‍රියාමාර්ග ගවේෂණය කිරීමට හැකි අතර, ඔවුන් ඒ තුළට යොමු කිරීම මගින් සාර්ථක සමාජයක් හා ඵලදායක අධ්‍යාපනික වටපිටාවක් ඇති කිරීමට අවස්ථාව සැලසේ.

මෙහිලා විශ්වවිද්‍යාලයීය සමස්ත ශිෂ්‍ය ප්‍රජාව ආවරණය වන පරිදි නිදර්ශක පනහක් යොදා ගනිමින් සමීක්ෂණයක් සිදු කළෙමු. එහිදී විශ්වවිද්‍යාලයේ බහුතරයක් බෞද්ධයන් බව අවබෝධ කර ගත්තෙමු. ඔවුන් අතරින් ද වැඩි පිරිසක් සමාජශීලී පෞරුෂයක් ඇති අය බව සමීක්ෂණයේදී සොයා ගන්නා ලදි. විහාරස්ථානය සමඟ පවත්වන සබඳතා ගත් විට තරමක සබඳතාවක් මේ අයට ද තිබී ඇති අතර ඒ අතරින් වැඩි දෙනෙකු දහම් පාසල් අවසාන විභාගය දක්වා ඉගෙනීම් කටයුතු සිදු කර ඇත. මෙම නිදර්ශක අතුරින් සෑම දෙනාම පාහේ භාවනාවක් සිදුකර ඇති අතර ඔවුන් එය ජීවිතයට අවශ්‍ය වැදගත් දෙයක් ලෙස ද විශ්වාස කරනු පෙනේ. එසේම වැඩිදෙනෙකු භාවනාවෙන් ඉහළ ප්‍රතිලාභයක් අත්කරගත හැකි බැව් විශ්වාස කරති. මේ අතරින් වැඩි දෙනෙකු විහාරස්ථානයට යන අවස්ථාවේදී භාවනාව සිදු කරන අතර එම වේලාව අදාළ ස්ථානය අනුව තීරණය වේ. එසේම බොහෝ දෙනෙකුට ගැටලුවක් පැමිණි විගස භාවනා කිරීමෙන් ප්‍රතිඵල අත්කරගෙන ඇත. එසේම භාවනාවේ යෙදෙන ලෙස වැඩිහිටියන් බොහෝ විට අවවාද කර ඇත. ඒ අතරින් වැඩි දෙනෙක් අනාපානාසති, මෛත්‍රී ආදී භාවනා කිරීමට සුවිශේෂී කැමැත්තක් දරති. තවද උදෑසන භාවනා කිරීම ඉතා සුදුසු බව ද පිරිසක් දක්වන අතර, ඊට සමානම පිරිසක් එය ඕනෑම වේලාවක සුදුසු බව දක්වති. බටහිර රටවල ජනප්‍රිය වෙනත් භාවනා ක්‍රම ගැන බහුතරයකගේ කැමැත්තක් නැති බව පැහැදිලිය.

මෙම පරීක්ෂණයට අනුව ප්‍රත්‍යක්ෂ වන කරුණ නම් ඔවුන් බොහෝ දෙනෙකුගේ ජීවිතයේ සාර්ථකත්වය සඳහා භාවනාව බලපා ඇති බවයි. ඔවුන් වැඩි දෙනෙකු විවිධාකාරයෙන් භාවනාව අත්හදා බලා ඇති අතර මේ සඳහා විශ්වවිද්‍යාල මට්ටමෙන් යම් කිසි මඟ පෙන්වීමක් ලැබෙන්නේ නම් එය වැදගත් වේ. සමාජයේ වැඩිහිටියන්ගේත් මේ පිළිබඳව මඟ පෙන්වීමක් ලැබෙන අතර ඔවුන්ට තම ජීවිතයේ වැදගත් අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමට අවශ්‍ය පසුබිම සකසා දිය යුතුය.

**ප්‍රමුඛ පද :** භාවනාව, පර්යේෂණය, ප්‍රතිඵල, මඟ පෙන්වීම

---

1 උපාධි අපේක්ෂක (ප්‍රථම වසර), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය